# නිවාඩුවේ දවස් හතක්



සනුලි සඳනිමා හේරත්

# නිවාඩුවේ දවස් හතක්

සනුලි සඳනිමා හේරත්

කතෘගේ වෙනත් කෘති ඃ චිරි චිරියේ සවාරියක්

මහාමායා බාලිකා විද්‍යාලය

5 වසර C

2025/02/08

ISBN 978-624-208-834-1

# පිදුම

නිවාඩුවක් ලැබුණු විටම අප
එන තුරු බලා සිටින නිවාඩුව
පුරාවටම අපට රස කෑම
සාදා දෙන ආදරණීය
අත්තම්මාට පුදමි.

# පටුන

01) අත්තම්මගේ ගෙදර.

02) සෙල්ලම් ගෙදර.

03) නාරං කැඩීම.

04) වෙරළු තැම්බීම.

05) හැංගිමුත්තං සෙල්ලම.

06) සැමගේ එකතුව.

07) සමුදීම.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණිගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



මුළු අවුරුද්දෙම වැඩ ඉවර කරලා දෙසැම්බර් මාසේ හම්බවෙන නිවාඩුව තමයි රසවත්ම නිවාඩුව.

ඒක ලස්සන ගමක්. ඒ අපේ අත්තම්මගේ ගම. නිවාඩුව හම්බවුන ගමන් අපි දුවගෙන යන්නේ අත්තම්මගේ ගෙදර. ඉතිං අපි මේ නිවාඩුවටත් අත්තම්මගේ ගෙදර ගියෙමු. අත්තම්මාගේ ගෙවත්ත හරිම ලොකුයි. මල් ගස්, පළතුරු ගස් ආදී විවිධ ගස් වලින් අත්තම්මාගෙ වත්ත පිරී තිබුණි. අත්තම්මාට විශාල එළවළු පාත්තියක් ද තිබුණි. ඒ එළවළු පාත්තියේ ඇවිදින්නට මම ඉතා කැමැත්තෙමි. එහි වම්බටු, බණ්ඩක්කා, මිරිස්, වැටකොළු , මෑකරල්, බතල , පුහුල් සහ විවිධ කොළ වර්ග තිබුණි. අත්තම්මාගේ කෑම ඒවා ඉතාම රසවත්ය. මම අත්තම්මාගේ කෑම වලට ද ඉතා කැමැත්තෙමි.

ඉතිං අත්තම්මාගේ ගෙදර මට දිව්‍ය ලෝකයකි.

## *නිවාඩුවේ පළමු දවස.*

1) අත්තම්මාගෙ ගෙදර.

අපි අත්තම්මාගෙ ගෙදර යන්න ලෑස්ති වුණෙමු. මම නිල් පාට සායකින් සහ කොළ පාට කමිසයකින් ද, නංගී නිල් පාට සායකින් සහ රෝස පාට කමිසයකින් ද, අම්මා ලා නිල් පාට දිගු කලිසමකින් සහ තද නිල් පාට කමිසයකින් ද, තාත්තා නිල් පාට කලිසමකින් සහ දම් පාට කොටු කොටු කමිසයකින් ද සැරසුනෙමු



අපි ගෙදරින් පිටත්ව ගියේ ප.ව. 4.00 ට පමණය. අපි අත්තම්මාගේ ගෙදරට යන විට වේලාව රාත්‍රී 10.00 ට පමණ විය. අපි අත්තම්මාගේ ගෙදර ගිය විට අත්තම්මා අපි එන තුරු මඟ බලා සිටින බව අපි දුටුවෙමු. අත්තම්මා මාව සහ නංගිව ආදරයෙන් වැළඳ ගත්තාය. ඉන් පසු අපි රාත්‍රී ආහාරය ගෙන දත් මැද මුණ සෝදා ගත්තෙමු. ඉන් පසුව මම හෙට දිනයේ සිදු වන්නේ කුමක්දැයි කියා හිත හිතා නින්දට ගියෙමි.

2) සෙල්ලම් ගෙදර.

මම උදෙන්ම අවදි වූවෙමි. මම අවදි වන විට වේලාව උදෑසන 6.30 පමණ විය. උදෑසන 6.30 සිට 8.30 දක්වා මම රූපවාහිනිය නැරඹුවෙමි.

ඉන්පසු මම මුළුතැන්ගෙයට ගොස් මුව සෝදා ගෙන අත්තම්මාට කොළ කැඳ සෑදීමට උදව් කළෙමි. මම අත්තම්මාට උදව් කළ පසු කෝප්පයක් ගෙන එයට කොළ කැඳ ස්වල්පයක් වත් කරගෙන බීවෙමි. කැඳ බී හමාර වූ පසු මම දත් මැද මුහුණ සෝදා ගෙන සෙල්ලම් කිරීමට ගියෙමි. නංගී ද මාත් සමඟ ගියාය. යහළුවෝ නංගිව සහ මාව දැක සතුටු වූහ.



"අපි අද සෙල්ලම් ගෙයක් හදමු" සඳුල කීවේය.

සැවොම එයට එකඟ වූහ. අපි එය අත්තම්මාගේ මිදුලේ සෑදීමට තීරණය කළෙමු. අපි ඇල්බීසියා අතු කපා කොළ ගලවා සෙල්ලම් ගෙදර බිත්තිය සහ වහලය සාදා ගත්තෙමු. ඉන්පසු අපි බිත්තිය වටා අත්තම්මාගේ සාරියක් එතුවෙමු. වහලයට පොල් අතු දැම්මෙමු. අපි සෙල්ලම් ගෙය යටින් ඉටි කවරයක් ද දමා ලිපක් ද සාදා ගත්තෙමු. ඉන්පසු අපි මල් පෝච්චි තියා සෙල්ලම් ගෙය සරසා ගත්තෙමු. සෙල්ලම් ගෙය සාදා අවසන් කළ විට වේලාව සවස 2.00 ට

පමණ විය. අපි සෙල්ලම් ගෙය තුළ සිට බත් කෑවෙමු. ඉන්පසු ලිපෙන් වතුර උණු කර කටරොළු පානයක් සාදා බීමෙන් පසු අපි ළිඳෙන් වතුර ඇඳ නෑවෙමු. පසුව අපි සැවොම එකතු වී සවස 3.30 සිට 6.00 දක්වා රූපවාහිනිය නැරඹුවෙමු. ඉන්පසු අපි සැවොම ගෙවල් වලට විසිරී ගියෙමු.

## නිවාඩුවේ තුන්වෙනි දවස.

3) නාරං කැඩීම.

සුපුරුදු පරිදි මම උදෑසනින්ම නැගිට රූපවාහිනිය නැරඹුවෙමු.පසුව අත්තම්මාට බත් පිසීමට උදවු කළෙමි. ඉන්පසුව මාළු සහ පොල් සම්බෝල සමඟ බත් කෑවෙමි. මම බත් කා හමාර වූ පසු දත් මැද මුහුණ සෝදා ගෙන නංගී ද සමඟ සෙල්ලම් කිරීමට ගියෙමු.



"අද අපි යමු නාරං කඩන්න" කේතක යෝජනා කළේය.

"ඔව් ඔව් ඒක හොඳ අදහස" සැවොම කීවෝය. අපි නාරං කැඩීම සඳහා කන්දට ගියෙමු.

"දැන් අපි නාරං කඩන්නේ මොකකින්ද?" කේතක ඇසුවේය.

"අන්න අතන රිටක් තියනවා." නංගි කෑ ගැසුවේය.

ඉන්පසු නාරං ගස අසළ තිබූ රිටෙන් අපි නාරං කඩුවෙමු. ඇඹුල් නාරං රස විඳීමෙන් පසු අපි අත්තම්මගේ ගෙමිදුලට පැමිණ බට්ටා පැන්නෙමු. බට්ටා පැනීම නිසා අපට වෙහෙසක් දැනෙන්නට විය.

"දැන් අපි මොකක්ද කරන්නේ?" නංගි ඇසුවාය.

"අපි සෙල්ලම් ගෙදරින් වතුර උණු කරගෙන බොමු." සඳුල ඇසුවේය.

"හා හා අපි එහෙම කරමු." සැවොම එකවවර කීවෝය.

ඉන්පසු අපි සෙල්ලම් ගෙදර ලිපෙන් වතුර උණු කරගෙන වදමල් සාදා ගෙන බිව්වෙමු. ඉන්පසුව සඳුලගේ අම්මා සඳුලට කතා කළාය.

"හවස් වී තිබෙන නිසා ගෙදර එන්න." කියා ඇය සඳුලට කීවාය.

පසුව සඳුල ගෙදර ගිය අතර අපිද විසිරී ගියෙමු. මම, නංගි, අම්මා සහ අත්තම්මා රාත්‍රී 7.00 සිට 7.30 දක්වා ප්‍රවෘත්ති නැරඹුවෙමු. ඉන්පසු මම රාත්‍රී ආහාරය ගෙන දත් මැද මුහුණ සෝදා ගෙන නින්දට ගියෙමි.

## නිවාඩුවේ හතරවෙනි දවස.

4) වෙරළු තැම්බීම.

එදින සඳුල අපිව පුදුම කරවමින් මහා වෙරළු පාර්සලයක් රැගෙන මිදුලට පැමිණියේය.



"අපි අද වෙරළු තම්බමු." සඳුල කෑ ගැසුවේය.

"ඇයි වෙරළු තම්බන්නේ" නංගි ඇසුවේය.

"මේ වෙරළු අමුයි. ඒ නිසා අපි මේවා තම්බලා අච්චාරු හදමු." සඳුල කීවේය.

ඉතිං අපි සෙල්ලම් ගෙදර ලිපෙන් වෙරළු තම්බා අච්චාරු සාදා ගෙන කෑවෙමු.

"ඒ වෙරළු නම් හොඳටම සැරයි. බඩත් දැවිල්ලයි වගේ" මම කීවෙමි.

"එහෙනම් අපි දැන් සෙල්ලම් ගෙදරින් වතුර එකක් උණු කරගෙන බොමුද?" නංගී ඇසුවාය.

"හා හා අපි සෙල්ලම් ගෙදර ලිපෙන් වතුර උණු කරගෙන බොමු. එතකොට මේ සැරත් අඩු වෙයිනේ" කේතක කීවේය.

ඉන්පසු අපි සෙල්ලම් ගෙදර ලිපෙන් වතුර උණු කර බිව්වෙමු.

"දැන් වේලාව කීයද?" සඳුල ඇසුවේය.

"ඉන්න මම බලන්නම්" මම කීවෙමි.

“වෙලාව සවස හයයි.” මම කීවෙමි.

“හවස හයයි” කේතක කෑ ගැසුවේය.

“මම දැන් ගෙදර යන්න ඕන” කේතක කීවේය.

“මමත් යන්න ඕන” සඳුල කීවේය.

“එහෙනම් අපි හෙට හමුවෙමු” මම කීවෙමි.

ඉන්පසු අපි විසිරී ගියෙමු.

5) හැංගිමුත්තං සෙල්ලම.



අත්තම්මා අපිව උදෑසනින්ම නැගිට්ට වූවාය.

"මට කැඳ හදන්න කොළ ටික කොටල දෙන්න" ඇය කීවාය.

අපි කුස්සියට ගොස් අත්තම්මාට කොළ කොටා දුන්නෙමු.

"අපි අද මොකද කරන්නේ?" කොළ කොටන අතරෙදි නංගි ඇසුවාය.

"අනේ මන්දා අද යාළුවෝ එයිද දන්නෙත් නෑ" මම කිව්වෙමි.

එතකොටම කේතක සහ ඔහුගේ නංගි කුස්සියට පැමිණියහ.

"අද අපි මොකද කරන්නේ?" මම ඇසුවෙමි.

"අද අපි හැංගිමුත්තං සෙල්ලම කරමු." කේතක කීවේය.

"හා හා අපි එහෙම කරමු" කියමින් සඳුල ද එතනට කඩා පැන්නේය.

ඉන්පසු අපි කැඳ බිව්වෙමු. කැඳ බී හමාර වූ පසු අපි හැංගිමුත්තං සෙල්ලම් කිරීමට ගියෙමු.

"කවුද හොයන්නේ?" නංගී ඇසුවාය.

“අපි හෝ දහය, විස්ස කරමු.” කේතක කීවේය.

“හෝ දහය, විස්ස, තිහ, හතළිහ, පනහ, හැට, හැත්තෑව, අසූව, අනූව, සියය. නංගි ගියා, සනුලි ගියා, මම ගියා, සෙනුලි ගියා” යනුවෙන් කේතක කීවේය.

“සඳුල තමයි හොයන්නේ” මම කිව්වෙමි.

“මම තිහට ගණන් කරන්නම්” සඳුල කිව්වේය.

“නෑ නෑ පනහට ගණන් කරන්න.” මම කිව්වෙමි.

“හා හා එහෙනම් මම පනහට ගණන් කරන්නම්.” සඳුල කිව්වේය.

“ඔන්න එහෙනම් මම ගණන් කරනවා.” සඳුල කිව්වේය.

මම දොර පිටි පස්සේ හැංගුණෙමි. නංගී ඇඳ යට හැංගුණාය.

“නංගිව දැක්කා.” සඳුල කිව්වේය.

“දැන් මම තමයි හොයන්නේ.” නංගී කිව්වේය.

ඔහොම සෙල්ලම් කරන අතරතුරදී අම්මා වදමල් පානයක් සාදා ගෙන ආවාය. අපි එය රස කර කර බිව්වෙමු. ඉන්පසු අපි නැවත සෙල්ලම කිරීමට පටන් ගත්තෙමු.

“මමත් එන්නද ඔයාලත් එක්ක සෙල්ලම් කරන්න.” අම්මා ඇසුවාය.

“හා හා” අපි සැවොම උස් හඬින් කිව්වාවමු.

අම්මත් පොඩිළමයෙක් වගේ අපිත් සමඟ සෙල්ලම් කළාය. හැංගිමුත්තං සෙල්ලම කිරීමෙන් අපට දැඩි වෙහෙසක් දැනුණි. ඒ නිසා අපි සෙල්ලම් ගෙදර ලිපෙන් වතුර උණු කර බිව්වෙමු.

“වෙලාව කීයද? අද මට සවස හතරට පන්ති තියෙනවා.” කේතක කීවේය.

“ඉන්න මම වෙලාව බලන්නම්.” මම කීවෙමි.

“වෙලාව තුනයි හතළිස් පහයි.” මම කිව්වෙමි.

“එහෙනම් අපි ගිහින් එන්නම්” සඳුල කීවේය.

“හා හා අපි හෙට හමුවෙමු.” මම කිව්වෙමි.

අපි සැවොම විසිරී ගියෙමු.

6) සැමගේ එකතුව.

අපි සියල්ලන්ම අත්තම්මා සමඟ උදෑසන තේ බොන වේලාවෙ දී අම්මාගේ නෑදෑ වන අක්කා කෙනෙක් එනම් මගේ ලොකු අම්මා කෙනෙක් අපේ නිවසට පැමිණියාය. ඇය, අම්මා සහ අත්තම්මා සමඟ ටික වේලාවක් කතා කරමින් සිටියාය. එක් වරම ඇය,



"මට ආසයි කොස් කන්න අපි කොස් කඩන්න කන්දෙ යමුද?" කියා ඇසුවාය.

"හා හා අපි යමු" අම්මා ඒ යෝජනාවට එකඟ වූවාය.

ඉන්පසු මම, සඳුල, නංගි, කේතක සහ අම්මා, ලොකු අම්මා සමඟ කන්දට ගියෙමු. කන්දට යන අතර මඟ දී අපිට මනුලි අක්කා, නෙත්මිණි අක්කා, සෙනුරි නංගි සහ පසිදු මල්ලීව මුණ ගැසුණි. ඒ සියල්ලෝම අපි සමඟ කන්දට ගියහ. කන්දෙදි අපිට පුංචි නංගි කෙනෙක්ද මුණ ගැසුණි. අපි වැස්ස නිසා පිරී ඉතිරී ගිය මනරම් දොළ පාරක් පසු කරමින් එක යායට තණ පිඩලි වැවී ඇති තණ බිස්සකට පැමිණියෙමු. එහි සිටි හරක් රංචුවක් අප දැක බියෙන් අප දෙස බැලුහ. කුරුල්ලන්ගේ නාදයත් ඇළේ වතුර ගලා යන ශබ්දයත් එකතු වූ විට ඉතා මිහිරි නාදයක් නැගෙයි. අපි සිටියේ කන්ද පාමුලයි. අපි ඒ අසළ තිබූ කොස් ගසකින් කොස් ගෙඩි දෙකක් කඩා ගත්තෙමු. ඉන්පසු අපි අම්මාගේ නෑදෑයෙක් වන බාප්පා කෙනෙකුගේ ගෙදර ගොස් කිරිබත් කෑවෙමු. පසුව අපි මනුලි අක්කාගේ ගෙදර ගියෙමු.

“අපි දැන් මොකද කරන්නේ” මනුලි අක්කා ඇසුවේය.

“අපි කබඩි කරමු.” සඳුල කීවේය.

“ඔව් ඔව් අපි කබඩි කරමු.” මම කිව්වෙමි.

“මමයි, සනුලියි, තෙනුලියි, කේතකයි එක පෙළක ඉන්නම්. නෙත්මිණයි, සෙනුරියි, සඳුලයි, පසිඳුයි එක පෙළක ඉන්න” මනුලි අක්කා කිව්වේය.

“හා හා එහෙම හොඳයි.” පසිඳු කිව්වේය.

“ඔයාල මුලින්ම පටන් ගන්න” මනුලි අක්කා කීව්වේය.

“මල් වර්ග” සෙනුරි නංගි කිව්වේය. ඒ පෙළේ හතර දෙනා කතා කර ගත්තෝය.

“රෝස, ඩේලියා, ලිලී, ටියුලිප්” සඳුල කීවේය.

“ලිලී” මනුලි අක්කා කීවේය.

අවසානයේ ජයග්‍රහණය කළේ අපේ පෙළයි. සෙල්ලම අවසන් වන විට අම්මා ලොකු අම්මා සහ මනුලි අක්කාගේ අම්මා කොස් තම්බා තිබුණි. අපි කරවල හොදි සහ පොල් සම්බෝල සමඟ කොස් කෑවෙමු. ඉන්පසු අපි ගෙවල් වලට ගියෙමු. ගෙදර ගිය පසු මම ළිඳෙන් නා ගත්තෙමි. නංගී ද ළිඳෙන් නෑවාය. පසුව අපි රාත්‍රී ආහාරය ගෙන නින්දට ගියෙමු.

*නිවාඩුවේ හත්වෙනි දවස.*

7) සමුදීම.

කලින් දින රාත්‍රියේදී අප්පච්චි අපිව නුවර රැගෙන යාමට පැමිණ සිටියේය. මට දැඩි දුකක් දැනුණි. ඒ සෙල්ලම් කාලය ඉවර වූ නිසායි. තව ටික කාලයක් ඉන්නට තිබුණා නම් කියා මට සිතුණි. පසු ගිය දවස් වල කළ දේවල් මට මැවි මැවී පෙනුණි. සෙල්ලම් ගෙදර සෑදු හැටි, කොස් කඩන්න ගිය හැටි, වෙරළු තම්බපු හැටි ආදී බොහෝ දේවල් මට මැවී පෙනුණි. නැවත ගෙදර යන්නට මට කිසිම ආසාවක් නැත. මම මගේ යහළුවන්ට ද අපි අද ගෙදර යන බව පැවසුවෙමි. ඔවුන්ටද එසේ දුකක් දැනුණි. මම යහළුවන්ට මේ ගැන පවසා ගෙදර ගොස් අත්තම්මා පිසූ රසම රස බත් අවසන් වරට කෑවෙමි. ඉන්පසු මම ළිඳෙන් නා ගෙන ඇඳුමක් ඇඳ ගත්තෙමි. පසුව අපි සියලු දෙනාම අත්තම්මාට වැඳ වාහනයට නැග පිටත් වූවෙමු. එවිට මට දැනුණේ දැඩි දුකකි.



මම වාහනය තුළ සිට ගම දෙස බලා සිටියෙමි. අපි ගමෙන් තව තවත් ඈතට යන බව දුටු මගේ නෙත් කඳුලින් තෙමුණි. අම්මා ලේන්සුවක් ගෙන මගේ දෑස්

පිස දැමුවාය. අපි නැවත ගමට එන බව අම්මා මට කිව්වාය. එවිට මට සිහිනයක් දැනුණි. එන මඟදී අප්පච්චි මාළු කඩයක් ඉදිරිපස වාහනය නැවැත් වූයේය. එවිට මම කඳුළු පිස දා ගෙන සතුටින් පිරුණු මුහුණකින් වාහනයෙන් බිමට බැස්සෙමි. ඉන්පසු අපි මාළු කඩෙන් බල මාළු, ඉස්සෝ සහ සාලයෝ ගත්තෙමු. අපි ගෙදර එන විට වේලාව රාත්‍රී නවයයි. ඉන්පසු අපි රාත්‍රී ආහාරය ගෙන දත් මැද මුහුණ සෝදා නින්දට ගියෙමු. එවිටත් මට කලින් දවස් ගත කළ හැටි මැවී පෙනුණි.

නිමි...



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ / සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහ ලේකම්.

ISBN 978-624-208-834-1